කෑගල්ල නගර සභාව,

කෑගල්ල දිස්ත්‍රික්කය

------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 15 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කෑගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ සැප්තැම්බර් සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා ලැබියයුතු උසාවි දඩ මුදල්වලට අදාල තොරතුරු උසාවිවලින් ලබාගෙන ඒ සඳහා ණයගැතියන් යටතේ ප්‍රතිපාදන වෙන්කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මුද්දර ගාස්තු ආදායම් ගිණුම්ගත කිරීමේදී ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් උපලේඛන ලබාගෙන ලැබියයුතු ආදායම් ගිණුම්ගත කර නොතිබුණු අතර ලැබී තිබුණු උපලේඛන අනුව 2015 ඔක්තෝබර් දක්වා ලැබියයුතු මුදල රු.9,631,667 ක් වුවත් එය රු.4,198,188 ක් ලෙස ගිණුම් වල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී අගය කරන ලද සභාවට අයත් තානායම හා එහි ඉඩම් වටිනාකම ප්‍රාග්ධනිත කිරීමේදී රු.300,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස පුස්තකාලයට ලැබී තිබුණු රු. 39,428 ක් වටිනා පොත් හා පොත් මිලදී ගැනීමේදී වට්ටම් ලෙස ලැබී තිබුණු රු.73,014 ක් ආදායම් වියදම් ගිණුමේ ආදායම් ලෙස දක්වා නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම

---------------------------

ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂයන්ගේ එකතුව රු.27,143,225 ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.23,127,447 ක් වූයෙන් වෙනස රු.4,015,778 ක් විය .

1.3.3 අවිනිශ්චිත ගිණුම

--------------------

2016 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය වූ රු. 3,657 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු ගිණුම්

-------------------

2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක කාලයක් ඉක්ම වූ ලැබියයුතු ගිණුම් ශේෂයන්හි එකතුව රු. 7,986,863 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

වටිනාකම රු.13,402,537 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාලව විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

1.3.6 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම

--------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව ගමනේ යෙදුනු මාසයට පසු මාසයේ 15 දිනට පෙර වාහන ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනය වෙත ඉදිරිපත් කළයුතු වුවත් සභාවට අයත් කිසිදු වාහනයකට අදාලව එපරිදි කටයුතු කර නොතිබුණි.

1.3.7 බලය නොලත් ගනුදෙනු

---------------------------

පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සේවා ගිවිසුම් මත සේවකයින් 20 ක් බඳවා ගෙන තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වැඩි ආදායම රු.42,086,583 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වැඩි ආදායම රු.53,037,862ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,951,279 ක පහත වැටීමක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,951,279 ක පහත වැටීම කෙරෙහි ආදායම් විෂයයන් 3 ක අඩුවීම හා වියදම් විෂයයන් 3 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

----------------------

2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

----------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2016.01.01 දිනට හිගය | 2016.12.31 දිනට හිගයෙන් අයකිරීම | 2016 වර්ෂයේ බිල් කිරීම | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2016.12.31 දිනට හිගය 2016.01.01 දිනටපැවති හිගයෙන් හිගය | වර්ෂයේ බිල්කිරීම් වලින් හිගය | මුළු හිගය |
|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 4,764 | 2,041 | 10,593 | 8,685 | 2,724 | 1,908 | 4,632 |
| (ii)බදු කුලී | 3,167 | 612 | 45,956 | 45,419 | 2,554 | 537 | 3,091 |
| (iii) බලපත්‍ර ගාස්තු | 81 | 59 | 759 | 754 | 22 | 5 | 27 |
| (iv)වෙනත් ආදායම් | 4,492 | 1,805 | 17,243 | 14,315 | 2,687 | 2,929 | 5,616 |
| එකතුව | 12,504 | 4,517 | 74,551 | 69,173 | 7,987 | 5,379 | 13,366 |

ඉහත හිග ආදායම් වාර්තා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමේදී 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිග ආදායම ගිණුමේ දක්වා ඇති හිග ආදායමට වඩා රු.32,161,658 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

### 2.3.2 වරිපනම් බදු අයකිරීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) යම් වරිපනම් බද්දක් හෝ අක්කර බද්දක් නොගෙවීම සම්බන්ධයෙන් වූ විට එම බද්ද අයවීමට ඇති ස්ථානයේ අයිතිකරුගේ දේපල තහනමට ගෙන විකිණීමෙන් හෝ මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වුවද නියැදි පරීක්ෂණය අනුව ඉඩම් හිමියන් හා වරිපනම් බදු ස්ථාන 46 කින් වසර 05 කට වැඩිකාලයක සිට අයනොවූ රු.683,795 ක වරිපනම් බදු අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි.

(ආ) වාර්ෂික වරිපනම් ගාස්තු අයකිරීම සඳහා වර්ෂ 05 කට වරක් දේපල තක්සේරු කර අයකිරීම් කළයුතු වුවද 2001 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් බදු අයකර තිබීම හේතුවෙන් සභාවට ලැබිය යුතු වරිපනම් ආදායම් නිසි පරිදි අය නොවී පැවතුණි.

### 2.3.3 වෙළඳ බලපත්‍ර ගාස්තු

නගර සභා බල ප්‍රදේශයේ 2014 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලැබූ වෙළඳ ආයතනයකින් අයවිය යුතු රු.22,000 ක වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 වෙනත් ආදායම්

(අ) වැසිකිළි ගාස්තු

වැසිකිළි ගාස්තු බිල් කිරීමේදී සමාලෝචිත වර්ෂයට අදාලව රු.3,000 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණු අතර වර්ෂ ගණනාවක සිට පැවත එන රු. 55,801 ක් වූ හඳුනා නොගත් හිග ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තානායම් කුලී

2014 වර්ෂයේ සිට හිගව පැවති තානායම් කුලී රු.502,026 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) සතිපොල ගාස්තු

පැරණි සතිපොල කඩකාමර හිමියන් 52 කගෙන් අයවියයුතු පොල ගාස්තු රු.1,532,780 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) නීතිඥ කාර්යාල සංකීර්ණයේ කුලී අය නොකිරීම

කෑගල්ල නගර සභා නීතිඥ කාර්යාල සංකීර්ණයේ රු.1,000 ක මාසික කුලිය මත පවත්වාගෙන යන කාමරයකට අදාලව හිග කුලී රු.40,000 ක් හා දඩමුදල් රු.71,500ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පුවාරක දැන්වීම් පුවරු

නගර සභා බල ප්‍රදේශයේ දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් 2016 වර්ෂයේ සිදුකර තිබුණද දැන්වීම් පුවරු 12 ක් සඳහා අයවිය යුතු රු.135,600 ක ගාස්තුවක් අයකර ගෙන නොමැති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඊ) බස් ගාල් ගාස්තු

2011 වර්ෂයට පෙර සිට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් අයවියයුතු රු.14,155 ක් හා අලව්ව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයෙන් 2012 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා අයවියයුතු රු.4,380 ක් අයකර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

----------------

ඔලගම පිහිණුම් තටාකය පළමු අදියර ඉදිකිරීම් කටයුතු සඳහා 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.8,865,977 ක් වැය කර තිබුණද දෙවන අදියර වැඩ ආරම්භ නොකිරීම නිසා තටාකය ප්‍රයෝජනයට ගත නොහැකිවීම හේතුවෙන් වැය කළ මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

3.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නගර සභා බල ප්‍රදේශයේ දිනකට දළ වශයෙන් එකතුවන ටොන් 15 ක් හෝ 20 ක් පමණ වූ කැලි කසල කඳු බෑවුම් සහිත ප්‍රදේශයකට අපහරනය කරමින් පැවතුණි.

(ආ) ගලි අපද්‍රව්‍ය ඉවත දැමීමට ස්ථානයක් නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී නගර සභාව විසින් එම සේවාව ක්‍රියාත්මක කර නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

---------------------------------------

4.1 <u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයන් 04 ක එකතුව රු. 5,026,000 ක ප්‍රතිපාදන සියයට 100 ක් හා වැය විෂයයන් 20 කට අදාලව ප්‍රතිපාදන වලින් සියයට 26 ත් සියයට 97 ත් අතර ප්‍රතිශතයකට සමාන රු.23,343,941 ක් උපයෝජනය කර නොතිබුණු අතර වැය විෂය 09 ක වෙන්කළ ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.13,358,396 ක් වැය කර තිබුණි.

5. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | <u>පද්ධතිය</u> | <u>නිරීක්ෂණය</u> |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) යන්ත්‍රසූත්‍ර වෙනුවෙන් උපලේඛනයක් ඉදිරිපත් නොකිරීම<br>(ii) ස්ථාවර වත්කම් සමීක්ෂණයට භාජනය නොකිරීම |
| (ආ) | තොග පාලනය | (i) ගිණුම්ශේෂ උපලේඛන සමඟ නොසැසඳීම<br>(ii) ගබඩා ණයගැති ගිණුම ක්‍රමවත්ව පවත්වා නොගැනීම |
| (ඇ) | ගිණුම්කරණය | අධි/ඌන වෙන්කිරීම් නිසි අධිකාරි බලයකින් තොරව කපා හැරීම |
| (ඇ) | ණයගැති/ණයහිමි පාලනය | (i) ප්‍රමාණාත්මක වටිනාකම සැලකිල්ලට නොගැනීම නිසා ඌන/ අධි වෙන්කිරීම සිදු කිරීම<br>(ii) ආදායම් ණයගැතියන් අයකර නොගැනීම |